පුද්ගලයෙකු විසින් පවුල් ආරාවුලක් මත සිය විවාහක බිරිඳට වෙඩි තබා ඝාතනය කළ පුවතක්, මාධ්‍ය තුළ (10/03)අවධානයට ලක්වී තිබිණි.

1) එහිදී මව්බිම පුවත්පත "අනියම් ඇසුරේ පවුල් ආරවුල උණ්ඩයට භාර දුන් තිත්ත කතාවක්" යන සිරස්තලයෙන් සහ "හොර අඹුවක්-හොර සැමියෙක් දෙන්නට දෙන්නා රණ්ඩු වෙලා" යන උප සිරස්තලයත් සමගින් පුවත් විශේෂාංගය ඉදිරිපත් කර තිබිණි. කෙසේ නමුත්, ලිපියේ අන්තර්ගතය තුළ ඔවුන් දෙදෙනා විවාහක බව මිස, අනියම් ඇසුරක් මෙම ඝාතනයට හේතු වූ බව නිශ්චිතව දක්වා නොතිබුණි.

2) එම පුවතම ඉරිදා දිවයින මගින් "මලක් සුණුවිසුණු කළ වෙඩිල්ලක්" යන සිරස්තලයෙන් ඉදිරිපත් කරයි. ඉරිදා ලංකාදීප පුවත්පත එය "බිරියගේ මරණයෙන් කෙළවරවූ අඹු සැමි ආරවුල" යන සිරස්තලයෙන් යුතුව ඉදිරිපත් කරයි. මෙම පුවත් වාර්තාවන් තුළද කිසිදු අනියම් ඇසුරක් මෙම ඝාතනයට හේතු වූ බවක් වාර්තා නොකරයි.

එසේ නම්,

මව්බිම පුවත්පත පමණක් මෙම විවාහක යුවළ "හොර අඹුවක්-හොර සැමියෙක්" ලෙසින් හඳුන්වන්නේ මන්ද?

මෙම පවුල් ආරවුලට හේතු වී ඇත්තේ "අනියම් ඇසුරක්" බව මව්බිම සිරස්තලයේ පමණක් සඳහන් කෙරී ඇත්තේ මන්ද?

ඒ අනුව, මෙම පුවත් වාර්තාවන්ගෙන් ඔබ තෝරාගන්නේ කුමක්ද?

**#MediaEthicsSL #lka #sinhalanews #SundayMawbima #SundayDivaina #SundayLankadeepa**